www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2008ට ඇතුලු වන විට ඉරාකයේ තත්වය

**The state of Iraq as it enters 2008**

**ජේම්ස් කොගන් විසිනි**
**2008 ජනවාරි 2**

ඉරාක ජනයාට 2008 කෙරෙහි තැබිය හැකි බලාපොරොත්තු වල අල්පතර බව හෝ ඔවුනට සැමරීම සඳහා 2007 වසරේ පැවතියේ ඊටත් අඩු තත්වයක් ය යන්න බැග්ඩෑඩයේ යම් ස්ථානයන්හි අලුත් අවුරුදු සාද පැවතුනෙ'ය යන මාධ්‍ය වාර්තාවන්ගෙන් නිශේදනය කල නොහැකිය. පසුගිය වසර මරනයේ, විනාශයේ හා පීඩාවේ තවත් එක් වසරක් විය. එක්සත් ජනපද හා ඉරාක ආන්ඩුවේ හමුදා සමග සටන් වැද මිය ගිය කැරලිකරුවන් ලෙස නම් කෙරුනු කොටස් ඉවත් කොට වාර්තාගත මරන පමනක් ඇතුලත් කෙරුනු අසම්පූර්න දත්ත ඇසුරෙන් සැකසුනු ඇසෝසියේටඩ් ප්‍රෙස් වාර්තාවන්ට අනුව ප්‍රචන්ඩත්වය නිසා සිවිල් වැසියන් 18,610 ක් මේ වනවිට මරනයට පත්ව ඇත. මන්දපෝෂනය, අපිරිසිදු පානීය ජලය, විකිරනශීලී යුරේනියම් විෂ වීම හා අක්‍රියාකාරී සෞඛ්‍ය ක්‍රමය නිසා තවත් දස දහස් ගනනක් මරනයට පත් විය.

පෙරදී ජෝන් හොප්කින් විශ්ව විද්‍යාලයේ විද්‍යාඥයින් විසින් ගනනය කෙරුනු මරන සංඛ්‍යාව සනාථ කරමින් බ්‍රිතාන්‍ය මැතිවරන ඒජන්සියක් වූ ඕ ආර් බී ආයතනය ඇමරිකානු ආක්‍රමනය යටතේ ඉරාක මරන සංඛ්‍යාව ලක්ෂ 12 ක් බවට ඇස්තමේන්තු කිරීම 2007 පිලිබඳ මතක සටහනකි. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ක්‍රමෝපායයන් මගින් උනන්දු කෙරුනු සමූහයන් අතර කුලල් කා ගැනීම් වලින් බේරීමට දශ ලක්ෂයකට අධික ඉරාක ජනයාට තම නිවාස අතහැර පලායාමට බල කෙරුනු වර්ෂය ලෙසද එය සැලකෙනු ඇත. අතිරේක 30,000ක පමන එක්සත් ජනපද හමුදා "රැල්ලක්" මාර්තු හා ජූනි අතර රටට පැමිනීම සමග ඉරාක මෑත ඉතිහාසයේ සිදු කෙරුනු දරුනුතම වාර්ගික ශුද්ධ කිරීම ලෙස සැලකීමට සාධක ඇති ක්‍රියා දාමය සිදු කෙරිනි.

දෙසැම්බර් 21දින යුනිසෙෆ් ආයතනය ප්‍රකාශයට පත් කල සමාජ විනාශයේ සංඛ්‍යාලේඛන වලින් එලිදරව් වන පරිදි 2007 වසරේදී අවසන් පාසැල් පරීක්ෂනයට මුහුන දුන් වයස අවුරුදු 17 ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 28ක් පමනි. ප්‍රචන්ඩත්වය නිසා පාසැල් යාමට නොහැකිවූ ප්‍රාථමික පාසැල් වල ශිෂ්‍ය සංඛ්‍යාව දස ලක්සයකට ආසන්නය.

ඇමරිකානු සංගත සංස්ථාපිතයේ වාසිය තකා රටෙහි දේශ සීමා හා තෙල් සම්පත් අත්පත් කර ගැනීම එල්ල කර ගනිමින් "සමස්ත සමාජයම හිතා මතා කෙරෙන ක්‍රමානුකූල ඝාතනයකට", එනම් සමාජ සංහාරයකට ලක් කිරීම පිලිබඳව ඉරාක ආක්‍රමනයේ නිර්මාපකයන් හට 2007 මැයි 24දින ලෝක සමාජවාදී වෙබ් අඩවිය කල චෝදනාව මෙම සංඛ්‍යාවන් මගින් සනාතවේ. මෙම යුධ අපරාධයන් පිලිබඳව බුෂ් පරිපාලනයේ හා ඊට සම්බන්ධිත ආන්ඩු වල වරදකරුවන් නීතිය ඉදිරියට ගෙන ආ යුතුය.

දස දහස් ගනන් ඇමරිකානු හා බ්‍රිතාන්‍ය මිලිටරි පවුල් තිත්ත මිලක් ගෙවා තිබේ. 2007දී ඉරාකය තුල ඝාතනය වූ ආක්‍රමනකාරී හමුදාවන්ගේ සංඛ්‍යාව 2003 මාර්තු ආක්‍රමනයෙන් පසුව වසරක් තුල ඝාතනය කෙරුනු ඉහලම සංඛ්‍යාව වේ. 901ක් ඇමරිකානු, 47ක් බ්‍රිතාන්‍ය හා නවයක් අනෙකුත් රටවල සොල්දාදුවන්ට ජීවිත අහිමි විය. අනීතික යුද්ධයෙන් මිය ගිය ඇමරිකානුවන්ගේ මුලු සංඛ්‍යාව 3904ක් වූ අතර ඇමරිකානු තුවාලකරුවන්ගේ මුලු සංඛ්‍යාව 28,661ක් විය. තුවාල ලැබූවන් බොහොමයක් මොලයේ ආබාධ වලින්, අත පය අහිමි වීම් වලින් හෝ වෙනත් ස්ථිර ආබාධයන්ගෙන් පෙලෙති. තවත් සොල්දාදුවන් 30,185ක් මානසික ආබාධ වැනි "නපුරු-නොවන" ආබාධ නිසා වෛද්‍ය නිර්දේශ මත ඉවත් කිරීමට සිදුව ඇත. අවම වශයෙන් ඇමරිකානු සොල්දාදුවන් 132ක් යුද්ධයෙන් ඇලලී ගිය රට තුලදී සිය දිවි හානි කර ගෙන තිබේ.

ඝාතන හා විකලාංගවීම් 2008දීද පවතිනවා ඇත. ඉරාකය තුල ඇමරිකානු අන දෙන නිලධාරී ජෙනරාල් ඩේවිඩ් පෙට්රායුස් දෙසැම්බර් 29 දින වසරේ අවසන් ප්‍රවෘත්ති සාකච්චාව තුලදී එක්සත් ජනපද හමුදා "රැල්ල" මගින් රට එක්සත් ජනපද ආධිපත්‍යයට යටත් කෙරුනේය යන ප්‍රකාශයට සිසිල් ජලය වත් කලේය. 2004 මුල සිට සැලකු කල අවම අනතුරු සංඛ්‍යාවක් වාර්තා වූ පසුගිය තෙමස පිලිබඳව අවධානය යොමු කරමින් ඔහු අනතුරු ඇගවූයේ "ඉදිරියේ දරුනු සටන්, වඩා දරුනු දින හා වඩා දරුනු සති නොවැලැක්විය හැකිය, දෙවියන්ගේ කැමැත්ත මත ඒවා ස්වල්පයක් වනු ඇත" යනුවෙනි.

පෙට්රායෙස්ගේ අනතුරු ඇඟවීමේ මූලය වන්නේ සුලු ප්‍රමානයකින් හෝ ඇමරිකානු හමුදාවන්ට පවතින අනතුරු සහගත තත්වය පහත වැටීමේ පවතින පැහැදිලි තාවකාලික ස්වභාවයයි. ආක්‍රමනික හමුදාවන්ට එල්ලවන ප්‍රහාරයන්ගේ පහත වැටීමේ මූලය වන්නේ එක්සත් ජනපද පැමිනීමට පවතින දැවැන්ත ඉරාක විරුද්ධත්වය කිසි ලෙසකින් වෙනස් වී තිබීම හෝ බහුතරයක් ඉරාක වැසියන් මුහුන දෙන අතිශයින්ම විනාශකාරී ජීවන කොන්දේසි යම් අයුරකින් හෝ වර්ධනය වීම නොවේ. එය ගලා එන්නේ පෙට්රායස් විසින් සැකසුනු මංමුලාසහගත ගනුදෙනු ගනනාවකිනි. විශාල වශයෙන් සුන්නි අරාබි කැරලිකාර කන්ඩායම් මිලට ගැනීම හා ආක්‍රමනයට විරුද්ධත්වය දක්වන ප්‍රධාන ෂියායිට් මූලධර්මවාදී විරුද්ධ පාර්ශවය වන මොක්ටඩා අල් සදාර් ගේ මෙදි හමුදාව සමග වෙඩි නැවැත්වීමේ ගිවිසුමක් ඇති කර ගැනීම ඊට අයත්ය.

මෙම ගනුදෙනු එළිදරව්වෙන්නට පටන් ගෙන තිබේ. එ.ජ. හමුදාවෙන් වැටුප් ලබන සුන්නි මිලීෂියාවරු අඩුම ගනනේ 77,000 ක් බටහිර ඉරාකයේ හා බැග්ඩෑඩයේ ඇතුලත සහ වටා ඇති සුන්නි ප්‍රදේශයන්ගේ සිටී. පෙර පැවති සදාම් හුසේන්ගේ බාත් රජය සමග සම්බන්ධකම් ඇති ඔවුන්ගේ නායකයෝ, බැග්ඩෑඩ්හි එ.ජ. රූකඩ ආන්ඩුවේ වැඩි බලයක් හිමි ෂියා මූලධර්මවාදී හා කුර්දි ජාතිකවාදී පක්ෂ සමග අධම නිකායවාදී බලය බෙදාගැනීමේ එකගතාවයක් තුලින් බලගතු දේශපාලන භූමිකාවක් බලාපොරොත්තුවෙන් පසුවෙති. මෙම ක්‍රියාවලියේදී, සියලු නිකායික හා ජාතික කන්ඩායම්වලට අයත් සාමාන්‍ය ඉරාක වැඩකරන ජනතාවගේ බලාපොරොත්තු සහ අපේක්ෂාවන්ට සෘජුවම එරෙහිවන වැඩපිළිවෙලකට මෙම කන්ඩායම් හරිබරි ගැසෙමින් සිටිති.

දැනටමත් සිරියාවේ සහ ජෝර්දානයේ සිටින විසි ලක්ෂයක් පමනවන ඉරාක අනාථයන් හට විය යුතු අයුරින් නැවතත් නිවස්බලා යාමට නොහැකිබව පවසනු ලැබ ඇත. ඔවුන්ගේ හැකියාව හෝ නොහැකියාව රඳපවතින්නේ තමන්ගේ ගම් නියම්ගම් දැනට පාලනය කරන මිලීෂියාවරුන්ට අයත් නිකායට ඔවුන් අයිති වනවාද නැතිද යන්න මතය. ෂියා මුස්ලිම්වරු දහස් ගනනක් සුන්නි මිලීෂියා අධිකාරිය යටතේ පාලනය වන ප්‍රදේශවලට ඇතුල්වීම වලක්වා ඇති අතර, එම ප්‍රදේශ බොහොමයක් එ.ජ. විසින් ගොඩනැගුනු අඩි 12 උස කොන්ක්‍රීට් තාප්ප වලින් වට කෙරී ඇත. මේ අතරේදී, ෂියා මිලීෂියාවරුන් විසින් පලවා හැරුනු දස දහස් ගනන් සුන්නි හා ක්‍රිස්තියානිවරුන්ට සියලුම දේ නැතිවන වාතාවරනයක් උදාවී තිබේ. පෙට්රියාස් සමග සදාර්ගේ ගනුදෙනුවේ කොටසක් ලෙස මෙදි හමුදාව විසින් බැග්ඩෑඩයේ විශාල කොටසක් තම භාරයට ගෙන ඇති අතර පූජකයන් වෙනුවෙන් නිකායික නින්දගමක් ලෙස පාලනය කරනු ලැබේ.

එ.ජ. කේවල් කිරීම් මගින් කැබලිවුන නගරය කෙරේ ඇති කෝපය සහ මිලීෂියාවන්ගේ පුලුල් වීම, රැකියා සහ මූලික සේවාවල් සැපයීමට ආක්‍රමනිකයන් හට පවතින නොහැකියාව නිසා උත්සන්න කෙරමින් පවතී. සදාර් නගරය වැනි ප්‍රදේශවල සේවා වියුක්තියේ සහ ඌන සේවා නියුක්තියේ සංයුතිය සියයට 70 ක අගයක් ගන්නා අතර නව ප්‍රතිරෝධයන් පැතිරීම් අනිවාර්ය වනු ඇත.

ෂියා ජනගහනයකින් යුතු දකුනු ඉරාකය පුරාවටම තත්වය ඒ සමානම චංචල ස්වභාවයක් ගනී ප්‍රායෝගිකව ගත් කල ආක්‍රමනය පිලිබඳ සදාර්ගේ පිලිවෙතෙහි අර්ථය, එ.ජ. මිලිටරියට සහ ආක්‍රමනිකයන්ට සහය දෙන විශාලතම ෂියා පක්ෂය හා ෂියා ව්‍යාපාර හා ආගමික ප්‍රභූවේ වඩා බලගතුම කොටස වන ශ්‍රෙෂ්ඨ ඉස්ලාමීය ඉරාක මන්ඩලයට (එස්.අයි.අයි.සී) තම වැඩි වශයෙන්ම කම්කරු පාන්තික වූ ආධාරකරුවන් අතහැර දැමීමයි. එහි ප්‍රථිපලයක් ලෙස, සිය ගනනක් වන සදාර් මිලීෂියාවරුන් "මැර කල්ලි" ලෙස හංවඩු ගසා හඹාගොස් අත්අඩංගුවට ගෙන හෝ මරා දමනු ලැබ ඇත.

සදාර්ගේ උග්‍ර කේවල් කිරීම් සහ එජ හමුදා සමග ඇති සහයෝගීතාවයේ ප්‍රතිවිපාක සම්බන්ධව සදාර් පදනම තුලින් මතුවන ක්‍රමයෙන් උග්‍ර වන කලකිරීම ඉරාක දේශපාලන නිරීක්ෂකයින්ගේ සැලකිල්ලට භාජනය වෙමින් පවතී. ජාත්‍යාන්තර අර්බුද කන්ඩායමේ පීටර් හාර්ලින් ගිය මාසයේ *මැක්ක්ලාර්චි* පුවත්පතට මෙසේ පැවසීය. "මෙය කොපමන ස්ථාවරදැයි මම දන්නේ නෑ. සදාර්ගේ ආධාරකරුවන් අතිශයින්ම කලකිරීමට පත්ව ඇති අතර මොක්ටාඩාගේ (සටන් විරාම) තීරනයට එකගවන්නට කැමැත්තෙන් සිටියත් එය දිගු කලකට නොවේ."

දෙසැම්බර් 26වනදා *වොෂින්ටන් පෝස්ට්හි* ලිපියකට අනුව, නජාෆ්, කර්බලා, හිල්ලා, සහ ඩිවානියා වල විශාල සංඛ්‍යාවක් අල්ලා ගනු ලැබ ඇත. එ.ජ. හමුදා එස්.අයි.අයි.සී. යට පක්ෂපාත ඉරාක රජයේ හමුදා සමග එක්ව, තෙල් සම්පත් සපිරි නගරයක් වන බස්රාහි සදාර්වරුන්ට සහ සදාර්වරුන් සමග සම්බන්ධකම් ඇති පක්ෂ, මිලීෂියාවන් හා වෘත්තිය සංගම්වලට එරෙහිව ප්‍රහාරයකට සැරසෙන බවට ඇඟවීම් පවතී. මෙය නව වසරේ ප්‍රථම ප්‍රධාන ලේ වැකි මෙහෙයුම විය හැකි අතර එය දකුනු ඉරාකය පුරාවට ආක්‍රමනිකයන්ට-එරෙහි කැරැලි මුදා හරිනු ඇත.

ඝාතන දිගටම සිදුවෙද්දී "ප්‍රජාතන්ත්‍රවාදය" සඳහා කොන්දේසි ස්ථාපිත කිරීමට ඇමරිකානු හමුදා ඉරාකය තුල රැඳී සිටිය යුතු බවට තර්ක කරන්නට, එජ පාලක ප්‍රභූවේ බොහෝ කොටස් තමන්ම නිෂ්පාදනය කල මහා ජන ඝාතනය උපයෝගී කරගනිමින් සිටිති. එවැනි ප්‍රචාරයන්, විසි එක් වෙනි සියවසේ ප්‍රථම, අති විශාල වූ සහ තවමත් සිදුවෙමින් පවතින යුධ අපරාධය පිලිබඳ ලජ්ජා රහිත ක්ෂමාලාපයකට වඩා යමක් නොවේ. නිකායික බෙදීම් වර්ධනය කරමින් සහ තම පැවැත්මට එරෙහිවන්නන් දෛනිකව මර්ධනය කරමින් ආක්‍රමනිකයින් තම පාලනය ගෙන යයි. එ.ජ. මූලිකත්වයෙන් ගෙනයන යුද්ධයෙන් ඇතිකර ඇති සමාජ සහ දේශපාලන ව්‍යසනයෙන් ඉරාකය මුදවාගැනීම සඳහා ඇති පූර්ව කොන්දේසිය වන්නේ, සියලුම ඇමරිකානු සහ විදේශ හමුදාවල ඉක්මන් හා කොන්දේසි විරහිත නික්මයාමයි.

© www.wsws.org